ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ ප්‍රවෘත්ති සංස්කාරක 20.08.2015

# මාධ්‍ය නිවේදනය

## කෘෂිකර්මාන්තය පිළිබඳ මූලික තොරතුරු : ආර්ථික සංගණනය 2013/14

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් 2013/14 යන වර්ෂ වලදී පළමුවරට ආර්ථික සංගණනයක් පවත් වන ලදි. මෙමගින් ආර්ථිකයේ ප්‍රධාන අංශයන් වන කෘෂිකර්ම, කර්මාන්ත, වෙළෙඳ හා සේවා යන අංශ ආවරණය කර ඇත. මෙහිදී කෘෂිකර්ම අංශයේ තොරතුරු රැස් කිරීම **"කෘෂිකාර්මික ගණන් ගැනීම"** යටතේ අදියර හතරකින් සිදු කරන ලදි. මෙහි පළමු අදියර යටතේ වතු ලැයිස්තු ගත කිරීම 2013 ජූලි මස සිදු කර ඊට අදාළ සාරාංශ වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදි. ඉතිරි අදියර තුන යටතේ විශාල ගොවි කාණ්ඩ (වතු) වල තොරතුරු රැස් කිරීම සහ කුඩා ගොවි කාණ්ඩ ලැයිස්තු ගත කර තොරතුරු රැස් කිරීම 2014 ජූලි, අගෝස්තු මාස තුල සිදු කර ඊට අදාල මූලික වාර්තාව සකස් කර ඇත. මේ යටතේ දිවයිනේ සමස්ථ ගොවි කාණ්ඩ සහ ගොවි කාරකයින් සංඛ්‍යාව, ගෙවතු සංඛ්‍යාව, සහ බිම් ප්‍රමාණය බෝග වගාව, සත්ත්ව පාලනය, යන විෂයන් ඇතුළුව රැස් කරන ලද තොරතුරු ජාතික සහ දිස්ත්‍රික් මට්ටමින් ඉදිරිපත් කර ඇත.

මෙම තොරතුරු වලට අනුව ශ්‍රී ලංකාවේ මුළු ගොවිකාරකයන් සංඛ්‍යාව 4,291,395 ක් ලෙස වාර්තා වී ඇත. මෙය 2002 වර්ෂයේ පැවති සංගණනයේ වාර්තා වූ මුළු ගොවිකාරකයින් සංඛ්‍යාවට වඩා 33.4% ක වැඩි වීමකි. වගා බිම් ප්‍රමාණය සැලකිල්ලට ගැනීමේදී 2013 වසරේ වගා කළ මුළු බිම් ප්‍රමාණය අක්කර 5,449,525 (හෙක්ටයාර් 2,205,392) ක් ලෙස වාර්තාවී ඇති අතර එය 2002 සංගණනයේ වාර්තාවූ අගයට වඩා 13.6% ක වැඩි වීමකි. ප්‍රධාන ආර්ථික බෝගයන් දෙකක් වන තේ, රබර් වගාවන්ගේ බිම් ප්‍රමාණයන් 2013 වසරේදී පිළිවෙලින් අක්කර 535,009 හා 298,659 ක් වූ අතර 2002 සංගණන වර්ෂයට වඩා එම බිම් ප්‍රමාණය පිළිවෙලින් 1.8%, 3.8% කින් ඉහළ ගොස් ඇත. පොල් වගා බිම් ප්‍රමාණය ක්‍රමවත් වගාව යටතේ අක්කර 438,028 ක් (හෙක්ටයාර් 177,268) වාර්තා වී ඇති අතර විසිරි වගාවට යටතේ තැඹිලි ගස් ද ඇතුලත්ව මුළු ගස් ගණන 42,013,773 ක් ලෙස වාර්තා වී ඇත. සත්ත්ව පාලනය සැලකීමේදී දිවයිනේ සමස්ථ එළ ගව සහ මී ගව ගහනය 2002 සංගණන වර්ෂය වඩා පිළිවෙලින් 7.2% කින් සහ 21.8% කින් අඩු වී ඇත. මෙම තොරතුරු ඇතුලත් වාර්තාව දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුලත් කර ඇති අතර මෙමගින් කුඩා ගොවිකාණ්ඩ අංශයේ තොරතුරු ගොවිකාරකයා පදිංචි දිස්ත්‍රික්කය අනුවද වතු අංශයේ තොරතුරු අදාල ගොවිකාණ්ඩය (වත්ත) පිහිටි දිස්ත්‍රික්කය අනුවද ඉදිරිපත් කර ඇත. (www.statistics.gov.lk)

ආචාර්ය ඒ.ජේ. සතරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
දුරකථන : 011 2147001/ 011 2147020
වෙබ් අඩවිය : www.statistics.gov.lk